බැංකු පනත් විධාන 2018 අංක 08 | 2018 නොවැම්බර් 21

# බාසල් III ද්‍රවශීලතා ප්‍රමිති යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වූ ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය

බැංකු අධීක්ෂණය පිළිබඳ බාසල් කමිටුව විසින් 2014 ඔක්තෝම්බර් මස වත්කම් සහ ශේෂ පත්‍රයෙන් පිටත ක්‍රියාකාරකම්වලට සම්බන්ධිතව ස්ථායී අරමුදල් සම්පාදනය කිරීම තහවුරු කිරීමේ අරමුණින් හඳුන්වා දෙන ලද බාසල් III: ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය ට අනුකූලව බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය ක්‍රියාත්මක කිරීමට මුදල් මණ්ඩලය විසින් 1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ 46(1) සහ 76(ඒ)(1) යන වගන්ති ප්‍රකාරව මෙම විධානයන් නිකුත් කරනු ලැබේ.

1. බලගැන්වීම

1.1 මුදල් නීති පනතේ 46(1) සහ 76(ඒ)(1) වන වගන්ති ප්‍රකාරව බැංකු පද්ධතියේ ශක්තිමත්භාවය තහවුරු කිරීම පිණිස සියලුම හෝ කිසියම් බලපත්‍රලාභී බැංකුවක් වෙත එකී බැංකු සිය ව්‍යාපාරවල ඕනෑම අංශයක් මෙහෙයවිය යුතු ආකාරය පිළිබඳව විධාන නිකුත් කිරීමට මුදල් මණ්ඩලය වෙත බලය පැවරී ඇත.

2. විෂය පථය

2.1 මෙම විධානයන් (i) ශ්‍රී ලංකාවේ ස්ථාපිත බලපත්‍රලාභී බැංකු සහ (ii) ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථාපනය කරන ලද බැංකුවල ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති ශාඛා සඳහා අදාළ වේ.

3. අවම ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය

3.1 2019 ජනවාරි 01 වන දින සිට සියලුම බලපත්‍රලාභී බැංකු විසින් පහත පරිදි අවම ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය පවත්වා ගත යුතු වේ.

| | | |
|---|---|---|
| බලපැවැත්වෙන දිනය | 2019.01.01 | 2019.07.01 |
| අවම අවශ්‍යතාවය | 90% | 100% |

4. අනාවරණ අවශ්‍යතා

4.1 සියලුම වාණිජ බැංකු ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය පහත පරිදි අනාවරණය කළ යුතුය.

(i) වාර්තා කරන කාලපරිච්ඡේදයට සහ පෙර කාලපරිච්ඡේදයට අදාළ ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය සහ එහි අවම අවශ්‍යතාවය:

(අ) පුවත්පත් සහ වෙබ් අඩවියෙහි - සෑම කාර්තුවක් අවසානයෙහි

(ආ) පුවත්පත්, වාර්ෂික වාර්තාව සහ වෙබ් අඩවියෙහි - වාර්ෂිකව

(ii) වාර්තා කරන කාලපරිච්ඡේදය හා පෙර කාලපරිච්ඡේදයට අදාළව 1 වන උපලේඛනයේ 1 වන පරිශිෂ්ඨයෙහි 1 වන කොටසෙහි සඳහන් තොරතුරු සහ ප්‍රධාන සංරචක පිළිබඳ විස්තර

(අ) සෑම කාර්තුවක් අවසානයේදී වෙබ් අඩවියෙහි

(ආ) වාර්ෂිකව වෙබ් අඩවියෙහි සහ වාර්ෂික වාර්තාවෙහි

| | | | |
|---|---|---|---|
| 5. | නියාමන වාර්තාකරණය | 5.1 | සියලුම බලපත්‍රලාභී බැංකු සෑම කාර්තුවකම අවසාන දිනයට අදාළව ගණනය කරන ලද ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය වෙබ් පාදක විතැන් සුපරීක්ෂණ පද්ධතියෙහි වාර්තා හරහා (BSD-QF-32-1A, BSD-QF-32-2A, BSD-QF-32-3A iy BSD-QF-32-3B) උපලේඛන 1 හි දක්වා ඇති පරිදි, කාර්තුව අවසන් වී මාසයක් ඇතුළත වාර්තා කළ යුතුය. |

අත්සන් කළේ,
ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**

මෙම විධානයේ උපලේඛනය I, පරිශිෂ්ඨ I සහ පරිශිෂ්ඨ II https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/Banking_Act_Direction_No_8_of_2018.pdf ඔස්සේ ලබාගත හැක.